**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරිම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 31 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.3 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ ගත කර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.12 (i,ii,iii) |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.14 |
| | | 3. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටුනොවීම. | 2.3 (අ) |
| | | 4. ව්‍යාපෘති ආරම්භ නොකර අත් හැරීම | 2.3 (ආ) |
| | | 5. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම | 2.3.1(ඇ) |
| | | 6. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3(ඈ) |
| | | 7. මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.3(ඉ) |
| | | 8. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.4 |

| | | | |
|---|---|---|---|
| | | 9. කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමේ අඩුපාඩු | 2.7 |
| | | 10. වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනයේ දුර්වලතා | 2.10 |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | 1. අනුකූල නොවීම් | 2.15 |
| | | 2. පොදු තැන්පත් ගිණුම | 2.13 |
| 128(1) (ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.5 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.12 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | හිඟහිටි ණය ශේෂ | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තු මත වියදම් දැරිම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරිම) | 1. විසඳා නොතිබෙන විගණන ඡේද | 2.8 |
| | | 2. කළමනාකරණ දුර්වලතා | 2.9 |
| | | 3. අවිධිමත් ගනුදෙනු | 2.6 |
| | | 4. අනාර්ථික ගනුදෙනු | 2.7 |

## 2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරයන්

--------------------------------------------------------

- දිස්ත්‍රික්කය තුල තිරසාර සංවර්ධනයක් තහවුරු කරනු වස් දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම, ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය.
- දිස්ත්‍රික් කෘෂිකර්ම සැලැස්ම පිළියෙල කිරීම හා ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල පද්ධතිය මැනවින් ජනතා හිතවාදීව කාර්යක්ෂමව පවත්වාගෙන යාම හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම.
- දිස්ත්‍රික් ආපදා කළමණාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා ආපදා සහන සැලසීම.
- ව්‍යවස්ථාපිත රාජකාරි ඉටු කිරීම.
- විවිධ ජාතිකත්වයන් සහ ආගම්වලට අයත් ජනතාව අතර සංහිඳියාව සහ සහජීවනය ඇති කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම.
- රජයේ ප්‍රධාන නියෝජිත ආයතනය වශයෙන් කටයුතු කිරීම හා රාජ්‍ය උත්සව සංවිධානය කිරීම.
- නිලධාරින්ගේ ආකල්ප කුසලතා සහ හැකියා වර්ධනය.
- දිස්ත්‍රික්කය තුල ඇති සියළුම රාජ්‍ය ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පැවැත්වීම.

## 2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළ යුතු කාර්යභාරයයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ ඇති ආයතන | ස්ථාපිත කිරීමේ අධිකාරි බලය | කාර්යභාරය |
|---|---|---|
| i අම්පාර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>ii අක්කරෙයිපත්තුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>iii අඩ්ඩාලච්චේන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>iv අලයාඩිවෙම්බු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>v දමන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>vi දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>vii ඉරක්කාමම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>viii කල්මුණ (දෙමළ) ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>ix කල්මුණ (මුස්ලිම්) ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>x කාරතිව් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xi ලාහුගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xii මහඔය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xiii නාවින්දවේලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xiv නින්දවූර් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xv පදියතලාව ප්රාදේශිය ලේකම් කාර්යාලය<br>xvi පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xvii සමන්තුරේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xviii සායින්දමරුදු ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xix තිරුක්කෝවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>xx උහන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 1992 අංක 58 දරන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත | 1. සියලු රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන නීත්‍යානුකූල විධිවිධාන තුළ සියලු කාර්යයන් සම්බන්ධීකරණය තුළින් මහජන සුභසාධනය හා සංවර්ධන කාර්යයන් ඉහළ නැංවීම.<br>2. කොට්ඨාශයේ සියලු ඉඩම් සම්බන්ධ කටයුතු.<br>3. වන සංරක්ෂණ , වනජීවී, සුරාබද්ද, මෝටර් වාහන, භූ විද්‍යා පතල් කැනීම්, වාරිමාර්ග,මැතිවරණ හාපුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ආදී අණපනත් වලින් පවරා ඇති රාජකාරි ඉටුකිරීම.<br>4. කොට්ඨාශය තුළ සමාජ සංවර්ධන කටයුතු මෙහෙයවීම හා ආපදා කළමනාකරණයට අදාළ කාර්යයන් ඉටු කිරීම.<br>5. රෙජිස්ට්‍රාර් රාජකාරී කටයුතු<br>6. රජයේ ආදායම් හා මූල්‍ය කටයුතු පිළිබඳ පාලනය හා මෙහෙයවීම. |

**2.3 කාර්යසාධනය**

**----------------**

**කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

**--------------------------------------------------------------**

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් වන පරිදි ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු සඳහා රු.මිලියන 65 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ අතුරින් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු වර්ෂය තුල සිදුකර නොතිබූ අතර, ඒ සඳහා වෙන්කර තිබූ රු.මිලියන 18.52 ක් වූ ප්‍රතිපාදන ක්‍රියාකාරී සැළැස්මේ තිබූ අනෙකුත් කාර්යයන් සඳහා භාවිතා කර තිබුණි.

**(ආ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැරීම**

**--------------------------------------**

අම්පාර දිස්ත්‍රික්කයේ අවිධිමත් අලෙවිකරුවන් 30 දෙනෙකු සඳහා වෙළෙඳ කුටි ඉදිකිරීම, ලාහුගල බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් සඳහා ගවයන් ලබාදීම හා පුළුන්ගස්මුල්ල ජල ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම යන කාර්යයන් සඳහා පිළිවෙලින් රු.3,000,000, රු.1,750,000 හා රු.250,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත්, අරමුදල් නොලැබීම හා අධීක්ෂණයක් සිදු නොකිරීම යන හේතුන් නිසා මෙම ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දමා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**--------------------------------------**

අම්පාර දිස්ත්‍රික්කයේ කළුපැනි බැද්ද පෙර පාසල ගොඩනැගිල්ල ඉදිකිරීම, වරාපිටිය විද්‍යාලයේ ක්‍රීඩාංගනය සංවර්ධනය හා මරණාධාර ගොඩනැගිල්ල ඉදි කිරීම හා මරංගල ප්‍රජා ශාලාව ඉදිකිරීම යන කාර්යයන් සඳහා 2014 වර්ෂයේදී පිළිවෙලින් රු.100,000, රු.191,304 හා රු.980,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත්, අක්මුදල් නොලැබීම හා කොන්ත්‍රාත් කටයුතු නිසි ලෙස අධීක්ෂණය සිදු නොකිරීම යන හේතු නිසා මෙම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

**(ඈ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**-------------------------------**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විශේෂ ව්‍යාපෘති සංවර්ධනය සඳහා ලබා දුන් රු.මිලියන 7.89 ක මුදල ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ප්‍රමාදයන් නිසා වර්ෂය අවසාන වන තෙක් උපයෝජනය කර නොතිබුණි.

**(ඉ) මුදල් නිදහස් කර තිබුණත් ක්‍රියාත්මක නොවුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) 2017 වර්ෂය තුළදී සම්මන්තුර හා නාවින්දවේලි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල පිළිවෙලින් ප්‍රතිලාභීන් 44 ක් හා 650 ක් සඳහා පිළිවෙලින් රු.1,900,000 ක් හා රු.1,493,500ක පිරිවැයක් දරා ආරම්භ කළ ජල ව්‍යාපෘති 02 ක් විගණිත දින වන 2018 මැයි මාසය වන විටත් ක්‍රියාත්මක කර අවසන් කර නොතිබුණි. එම හේතුව නිසා එම ප්‍රදේශවල මූලික අවශ්‍යතාවයක් වන පානීය ජලය ලබා දීමේ අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි.

(ii) නාවිදන්වේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේදී ප්‍රතිලාභීන් දෙදෙනෙකුට ජල සැපයුම් ලබාදීමට රු.17,820 ක මුදලක් ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා ඇතත්, විගණිත දින වන 2018 මැයි 25 දක්වා එම ප්‍රතිලාභීන් දෙදෙනාට ජල පහසුකම් ලබාදී නොතිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදන වෙන්කිරීම් මගින් වැය විෂයයන්ට අදාළව රු.මිලියන 89.07 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර රු.මිලියන 88.89 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. එයට අමතරව රේඛීය අමාත්‍යාංශ මඟින් රු.මිලියන 2,222 ක ප්‍රතිපාදන විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ලබා දී තිබුණි. මෙම ප්‍රතිපාදන උපයෝජනය සඳහා අනුගමනය කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිරීක්ෂණ වූ කරුණු පහත පරිදි වේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් ලබාදීමට ප්‍රථම අදාල සංවිධාන නියමිත සුදුසුකම් සපුරා තිබේද යන්න පිළිබඳව තහවුරු කරගත යුතුද, එසේ තහවුරුවකින් තොරව පදියතලාව හා සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමිති 31 ක් වෙත එකතුව රු.මිලියන 31 ක කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු මිල ගණන් විවෘත කිරීමේදී ලංසු මිල ගණන් ඉදිරිපත් කල ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු සහභාගි විය යුතු වුවද, එසේ සහභාගී නොවී ඉරක්කාමම්, සම්මන්තුර හා උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු.මිලියන 4.25 ක කොන්ත්‍රාත් 03 ක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලියාපදිංචි සමිතියක් සඳහා එක් වරකට දිය හැකි උපරිම කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 2 ක් වුවද සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් සමිතියකට රු.මිලියන 3 ක කොන්ත්‍රාත් ලබාදී තිබුණි.

**2.5** **වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ)** **වාහන උපයෝජනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව පැවති මෝටර් රථයක් සඳහා 2017 වර්ෂයේදී රියදුරු වැටුප් හා දීමනා හැර අළුත්වැඩියා වියදම් ලෙස රු.22,350 ක වියදමක් දරා තිබූ නමුත්, පරිපාලන නිලධාරි විසින් තහවුරු කල ඇති පරිදි වර්ෂය තුලදී එක් කිලෝමීටරයක් හෝ ධාවනය නොකර නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**(ආ)** **නිෂ්ක්‍රීය වත්කම්**

නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වූ පරිදි නිෂ්ක්‍රීයව පැවති වත්කම් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

(i) නැගෙනහිර පළාත් සභාවේ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මඟින් 2016 වර්ෂයේදී රු.මිලියන 10.6 ක වටිනාකමින් නින්දවූර් ප්‍රදේශයේ ඉදිකරන ලද ආයුර්වේද ගොඩනැගිල්ල විගණිත දිනය වූ 2018 ජනවාරි දක්වා වසර 02 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ii) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නොරොච්චෝලේ නිවාස යෝජනා ඉඩමේ (King Abdulla Model Town) ඉදිකරන ලද නිවාස සඳහා සවිකිරීමට ලබාගෙන ඇති විදුලි උපකරණ හා නාන කාමර අයිතමයන් සවි නොකර වර්ෂ 07 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(iii) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් කුඩා ඇඟළුම් කම්හල් ආරම්භ කිරීම සඳහා මාස 06 ක පුහුණුවක් ලබාදීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් වෙත 2017 අගෝස්තු මාසයේදී රු.3,795,934 ක වටිනා යන්ත්‍රෝපකරණ ලබා දී තිබුණි. එසේ වුවද, 2018 අප්‍රේල් වන විටත් එම යන්ත්‍රෝපකරණ භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

**2.6** **අවිධිමත් ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ)** **අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු සිදුකර තිබුණි.

(i) දිස්ත්‍රික් ලේකම් විසින් 2017 වර්ෂය සඳහා පැවරූ අධිකාරි බලය අනුව ප්‍රාදේශීය ලේකම්වරයෙකුට උපරිම වශයෙන් මිලදී ගත හැකි යන්ත්‍ර හා උපකරණ වල වටිනාකම රු.මිලියන 1 ක් වූවද, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එයට පටහැනිව රු.1,479,789 ක් වටිනා උපකරණ මිලදී ගැනීමට රු.1,000,000 ක වටිනාකමක් සඳහා චෙක්පත් 18 ක් නිකුත් කර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා ගෙවිය යුතු ඉතිරි වූ රු.479,789 මුදල 2017 ඔක්තෝබර් 07 දින වන විටත් ගෙවා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 135 අනුව දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම්වරු සඳහා පවරා ඇති බලය යටතේ, ප්‍රදේශීය ප්‍රසම්පාදන කමිටුවට යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට ඇති උපරිම සීමාව රු.මිලියන 1 දක්වා වූවද, දෙහිඅත්තකණ්ඩිය හා අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළිවෙලින් අවස්ථා තුනකදි හා එක් අවස්ථාවකදී දී රු.මිලියන 1ට වැඩි මිළදී ගැනීම් සිදුකර තිබුණි.

(iii) රජයට අයත් ඉඩමක යම් ඉදිකිරීම් කටයුත්තක් සිදු කිරීමට පෙර ඒ සඳහා ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉඩම පවරා ගැනීමක් සිදුකල යුතු වූවත්, එයට පටහැනිව 2015 වර්ෂයේදී නැගෙනහිර පළාත් වෛද්‍ය දෙපාර්තමේන්තුවෙන් ලද රු.මිලියන 10.6 ක ප්‍රතිපාදන යටතේ නින්දවූර් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ආයුර්වේද ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

**2.7 අනාර්ථික ගනුදෙනු**

---------------------

බන්ධනාගාර හා පුනරුත්ථාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ජල ව්‍යාපෘතීන් අවතැන් වූ හා යළි පදිංචි කරන ප්‍රදේශවල ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක විය. එසේ වුවද, එයට පටහැනිව සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රදේශයේ රාජ්‍ය ආයතන වල සේවය කරන හා අවතැන් නොවූ නිලධාරින් 08 දෙනෙකුට මෙම ව්‍යාපෘතිය යටතේ ජල සැපයුම් ලබාදීමට රු.442,832 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. මේ හේතුවෙන් අවතැන් වූ 08 දෙනෙකුට ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ ලබා ගැනීම අහිමි වී තිබුණි.

**2.8 විසඳා නොතිබුණු විගණන ඡේද**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව ඉකුත් වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 3.6(ආ) i | මහඔය බල ප්‍රදේශයේ ආරම්භ කල කළුපැනිබැද්ද පෙර පාසල් ගොඩනැගිල්ල හා මරණාධාර සමිති ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අවසන් නොකිරීම. |
| 2015 | 3.6(ආ) iii | මහඔය බල ප්‍රදේශයේ පිහිටි වරාපිටිය විද්‍යාලයේ ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් නොකිරීම. |

| | | |
|---|---|---|
| 2015 | 3.6(ආ) iv | පදියතලාව බල ප්‍රදේශයේ පිහිටි මරංගල ප්‍රජා ශාලාවේ ඉදිකිරීමේ කටයුතු අවසන් නොකිරීම. |
| 2016 | 3.2.1 (අ) i | නාවින්දවෙලි හා අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගවයින් 79 දෙනෙකු මිලදී ගැනීම සඳහා වැඩිපුර ගෙවන ලද රු.3,860,500 ක මුදල අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2016 | 3.15 | ආයතන සංග්‍රහයට පටහැනිව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියා හා ඔහුගේ කාලත්‍රයා වෙළඳපොලක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම. |

## 2.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) බන්ධනාගාර හා යළි පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කල ජල ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන්ට සහනදායී ඇස්තමේන්තුවක් යටතේ නව ජල සම්බන්ධතා ලබා දිය යුතු නමුත්, එයට පටහැනිව සමන්තුරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් 17 දෙනෙකුට සමෘද්ධි ප්‍රතිලාභීන් නොවන සේ සලකා සහනදායී නොවූ ඇස්තමේන්තු මුදල යටතේ ජල සම්බන්ධතා ලබාදී තිබුණි.

(ii) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ව්‍යවසායන් සංවර්ධනය සඳහා උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.1,071,669 ක් ලබා දී තිබුණි. කෙසේ වුවද, එයින් රු.101,857 ක මුදලක් ප්‍රතිලාභීන් වෙනුවෙන් වියදම් නොකර නැවත අමාත්‍යාංශය වෙත හරවා යවා තිබුණු බැවින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(iii) ජාතික සමඟිය හා සංහිඳියා අමාත්‍යාංශය ක්‍රියාත්මක කල ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 98 දෙනෙකුට පුහුණුව ලබාදීම සඳහා රු.47,000 ක මුදලක් සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී තිබූ නමුත්, 2018 මාර්තු 22 දිනය වන විටත් එම පුහුණුව ලබාදී නොතිබුණි.

(iv) බන්ධනාගාර හා යළි පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ මුළු මුදලම ප්‍රතිලාභීන් වෙනුවෙන් වියදම් කළ යුතු වූවත්, මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.183,610 ක මුදලක් එලෙස වැය නොකර ආපසු යවා තිබුණි. ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම කාලීනව සිදු නොකිරීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(v) ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලට ප්‍රතිලාභීන් පුහුණු කිරීම සඳහා එක් ග්‍රාම සේවා වසමකට රු.7,275 මගින් ග්‍රාම සේවා වසම් 12 සඳහා රු.87,300 ක ප්‍රතිපාදන වෙත ලැබී ඇතත්, ඉන් රු.52,745 ක මුදලක් පුහුණුවීම් සඳහා වැය නොකර නැවත අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

## 2.10 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ------- | -------------- | ------------- | -------------- | -------- | ----------------- |
| | | රු. | රු. | රු. | |
| 2013 | පුනරාවර්තන | 673,687,000 | 672,588,832 | 1,098,168 | 0.16 |
| | මූලධන | 710,000 | 709,470,599 | 529,402 | 0.07 |
| | **එකතුව** | **1,383,687,000** | **1,382,059,431** | **1,627,570** | **0.11** |
| 2014 | පුනරාවර්තන | 654,795,000 | 654,769,799 | 2,520 | 0.00 |
| | මූලධන | 401,200,000 | 400,960,068 | 239,932 | 0.05 |
| | **එකතුව** | **1,055,995,000** | **1,055,729,867** | **242,452** | **0.02** |
| 2015 | පුනරාවර්තන | 778,251,000 | 778,250,111 | 889 | 0.00 |
| | මූලධන | 64,000,000 | 63,999,979 | 21 | 0.00 |
| | **එකතුව** | **842,251,000** | **842,250,090** | **910** | **0.00** |
| 2016 | පුනරාවර්තන | 886,000,000 | 859,738,743 | 26,261,257 | 0.29 |
| | මූලධන | 77,000,000 | 76,878,237 | 121,763 | 0.15 |
| | **එකතුව** | **963,000,000** | **936,616,980** | **26,383,020** | **2.73** |
| 2017 | පුනරාවර්තන | 884,640,000 | 795,587,249 | 89,052,751 | 10.06 |
| | මූලධන | 86,000,000 | 85,998,582 | 1,418 | 0.00 |
| | **එකතුව** | **970,640,000** | **881,585,831** | **89,054,169** | **9.17** |

**වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් අමාත්‍යාංශ 11 ක් විසින් විවිධ කාර්යයන් සඳහා රු.මිලියන 2,222 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 1,969 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 253 ක් හෙවත් සියයට 11 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**2.10.1 ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය**

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති හා ජීවනෝපාය සහාය ව්‍යාපෘති යටතේ පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉහත වැඩසටහන යටතේ හුලංනුගේ ග්‍රාමසේවා වසම තුල ඉදිකල කෘෂි ළිඳ පිළිබඳ භෞතික පරීක්ෂාවේදී ඉදිකිරීම් අවසන් කර ඇති පොළව මට්ටමේ සිට ගැඹුර මීටර 6.25 ක් වෙනුවෙන් පමණක් ගෙවීම් සිදුකල යුතු වුවත්, ගැඹුර මීටර 9.4 ක් සඳහා ගෙවීම් කර තිබුණි. එබැවින් ඉදිකිරීම් සිදු නොකරන ලද ගැඹුර මීටර 3.15 ක් වෙනුවෙන් රු.133,904 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ඉහත වැඩසටහන යටතේ ග්‍රාම සේවා වසම් 02 ක් එකතු වී සිදු කළ කල්වට් පුනරුත්ථාපන ව්‍යාපෘතියට අදාලව සකස් කල ඇස්තමේන්තුවේ අයිතම අංක 07 අනුව $10m^3$ ක් කොන්ක්‍රීට් දැමීම සඳහා අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.185,300 ක් ගෙවා තිබුණි. නමුත් භෞතික පරීක්ෂාවේ දී

අනාවරණය වූ පරිදි නිම කළ ප්‍රමාණය 6.35 $m^3$ බව තහවුරු වූ බැවින් රු.77,350 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) ඉහත වැඩසටහන යටතේ එක් ග්‍රාම සේවා වසමක් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාල චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු හා ජීවනෝපාය පහසුකම් වැඩ සටහන යන කාර්යයන් දෙකම ඉටුවන පරිදි යොදා ගත යුතු වුවත්, ඊට පටහැනිව අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම සේවා වසම් 21 සඳහා ලද රු.මිලියන 11 ක් වූ මුළු මුදලම කොන්ත්‍රාත් කටයුතු සඳහා පමණක් යොදා ගෙන තිබුණි.

(iv) කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා මැෂින් මිල ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිල ගණන් 05 ක් කැඳවා සුදුසු මිල තෝරා ගත යුතුය. එසේ වුවද, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඊට පටහැනිව එක් පෞද්ගලික ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා රු.1,479,789 ක වටිනා මැෂින් 53 ක් මිලදී ගෙන තිබුණි.

(v) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉහත වැඩසටහන යටතේ මිලදී ගත් මැෂින් සඳහා අදාල මිල ගණන් පිළිබඳ විස්තර විගණනයේදී සෘජුවම සැපයුම්කරුවන්ගෙන් ලබා ගත් අතර, එම මිල ගණන් අනුව මැෂින් 53 ක් සඳහා රු.1,404,750 ක් ගෙවිය යුතු වුවද, රු.1,479,789 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.75,039ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(vi) සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙර අදාල ඉඩමේ නිරවුල් අයිතිය පිළිබඳ තහවුරු කර ගත යුතු වුවත්, ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකල රු.1,463,864 ක සංවර්ධන ව්‍යාපෘතියකට අදාල භූමියේ අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(vi) මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබා දීමට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 80 දෙනෙකු අමාත්‍යාංශය විසින් නිකුත් කල චක්‍රලේඛයේ නිර්ණායකයන් පදනම් කරගෙන තෝරාගත් බව ප්‍රකාශ කර ඇති නමුත්, ප්‍රතිලාභීන් තෝරාගත් ආකාරය සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) **විමධ්‍යගත අරමුදල් යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති**

---------------------------------------------------------

2017 වර්ෂයේ ඉහත වියාපෘතිය යටතේ අක්කරපත්තුව බල ප්‍රදේශයේ ක්‍රීඩාපිටියක් සංවර්ධනය කිරීමට රු.500,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. නිවැරදිව ශක්‍යතා අධ්‍යයනයක් හා ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ බැවින්, රු.223,373 ක වටිනාකමට අදාල සංවර්ධන කටයුතු පමණක් සිදු කිරීමෙන් පසු ව්‍යාපෘතිය අතරමඟ නවතා දමා තිබුණි.

**2.10.2 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය**

---

ඉහත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සේවක පුහුණුව සඳහා කුඩා ඇගළුම් කර්මාන්තශාලා ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය

---

(i) ඉහත ව්‍යාපෘතිය යටතේ මාස 06 ක පුහුණුවක් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් සඳහා රු.4,254,960 ක වටිනාකමකින් යුත් යන්ත්‍රෝපකරණ 2017 අගෝස්තු මාසය වන විට ලබාදී තිබූ නමුත්, විගණිත දින වන 2018 මැයි දක්වා මාස 08 ක් ගතවන විටත් අදාල අරමුණ වෙනුවෙන් ඒවා භාවිතා කර නොතිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතිය යටතේ මාස 06 ක කාලයක් සඳහා එහි ගුරු හා මුරකරු වැටුප් ගෙවීම සඳහා පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.365,000 ක් ලබා දී තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් රු.293,833 ක මුදලක් අදාල අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර ආපසු අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

(ආ) ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යවසායන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති

---

මෙම වැඩසටහන යටතේ රු.38,684,782 ක මුදලක් මෙම අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දැනුවත් කිරීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක බැංකු ගිණුම්වලට තැන්පත් කර තිබුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සැලසුම් කිරීම, ප්‍රමුඛතා හඳුනා ගැනීම හා අරමුදල් සාධාරණ ලෙස බෙදී යාම යන අවශ්‍යතා නිසි පරිදි සපුරා නොගෙන ව්‍යාපෘතිය සිදුකර ඇති බවට හඳුනාගත් නිරීක්ෂණ පහත පරිදිය.

(i) ඉහත ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම නිශ්චිත පදනමක් මත නිවැරදි ක්‍රමවේදයක් යටතේ සිදුකල යුතු වුවත්, එයට පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරිවල නිරත නොවන විවිධ පුද්ගලයන් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ප්‍රතිලාභීන් 1,601 ක් සඳහා රු.33,058,330 ක වටිනාකමින් යුත් ද්‍රව්‍යය හා උපකරණ ලබාදිය යුතු බව තීරණය කර වටිනාකම රු.18,065,865 ක් වූ උපකරණ මිලදී ගෙන තිබුණි.

(ii) මෙම ක්‍රමවේදය තුල මිලදී ගත් භාණ්ඩ අතරින් රු.10,465,375 ක වටිනාකමින් යුත් ද්‍රව්‍ය හා උපකරණ අදාල ප්‍රතිලාභීන්ට ලබා නොදී මාස 04 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**2.10.3 ජාතික සමඟිය හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය**

---

මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කල ජීවනෝපාය සහාය ව්‍යාපෘතිය යටතේ නිරීක්ෂණය වූ කරුණු පහත පරිදිය.

(i) මෙම අමාත්‍යාංශය යටතේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන්ට බෙදා දීමට එළුවන් මිලදී ගැනීමේදී 1958 අංක 29 දරන සත්ත්ව පනත අනුව පශු වෛද්‍යය නිලධාරියාගෙන් සතුන්ගේ සෞඛ්‍යය තත්ත්වය පිළිබඳ සහතිකයක් ලබාගත යුතු වුවත්, එයට පටහැනිව රු.3,916,200 ක වටිනාකමකට එළුවන් 314 දෙනෙකු මිලදී ගෙන බෙදා දී තිබුණු

අතර, භෞතික පරීක්ෂාවේදී රු.286,200 ක වටිනාකමකින් යුත් එළුවන් 30 දෙනෙකු මියගොස් තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතිය යටතේ සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.135,000 ක වටිනාකමින් යුත් උපකරණ බෙදා දීමට මුලින් තෝරාගත් ප්‍රතිලාභීන් 15 දෙනා විසින් අදාල උපකරණ අත්‍යවශ්‍ය නොවන බව ප්‍රකාශ කල බැවින් පසුව වෙනත් ප්‍රතිලාභීන් 15 දෙනෙකුට මෙම උපකරණ බෙදා දී තිබුණි. එබැවින් ප්‍රතිලාභීන් තේරීම හා උපකරණ ලබාදීමේ ක්‍රමවේදය අවිධිමත් බව නිරීක්ෂණය විය.

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 10 දෙනෙකුට බෙදා දීමට රු.975,650 ක් වැයකර එළුවන් 40 දෙනෙකු මිලදී ගෙන තිබුණි. භෞතික පරීක්ෂාවේදී එක් ප්‍රතිලාභියෙකු සඳහා ලබාදුන් රු.97,565 ක වටිනාකමින් යුත් එළුවන් 04 දෙනෙකු ප්‍රතිලාභියා සතුව නොවුණි.

(iv) අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී බන්ධනාගාර හා පුනරුත්ථාපන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මිලදී ගත් රු.1,559,030 ක වටිනාකමින් යුතු ද්‍රව්‍ය හා උපකරණ සඳහා එක් චෙක්පතකින් ගෙවීම් වෙනුවට චෙක්පත් 11 කින් වෙන වෙනම ගෙවීම් සිදු කිරීම නිසා වියදම් සීමාව ඉක්මවීම වළක්වා ගෙන ඇති බවත් නිරීක්ෂණය විය.

**2.10.4 නැගෙනහිර පළාත් අධ්‍යාපන තොරතුරු, තාක්ෂණ, පෙර පාසල් අධ්‍යාපන, ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, යෞවන කටයුතු හා පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය**

**-----------------------------------------------------------------------------------------------**

මෙම ප්‍රතිපාදන යටතේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද පළාත් විශේෂ සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතිය (PSDG) සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) ඉහත ව්‍යාපෘතිය යටතේ කන්චිකුඩිච්චිආරු ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 75 දෙනෙකුට වැලි ලබාදීම සඳහා රු.436,875 ක චෙක්පතක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 07 දින කොන්ත්‍රාත්කරුට ලබාදී තිබුණි. එසේ වුවද, අදාල වැලි ලබා නොදී එම චෙක්පත 2017 අප්‍රේල් 17 දින මුදල් කරගෙන තිබුණි. නමුත් ප්‍රතිලාභීන් වෙත වැලි ලබා නොදී මාස 02 කට පසු ගිණුම් වලට අදාල මුදල් තැන්පත් කර තිබූ නිසා කොන්ත්‍රාත්කරුට එම මුදල් අවභාවිතා කිරීමට මඟ පැදී තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතිය යටතේ තංගවේලායුධපුරම් ප්‍රදේශයේ ප්‍රතිලාභීන් 126 දෙනෙකු සඳහා සැපයූ වැලි කියුබ් (ට්‍රැක්ටර්) 252 සඳහා ගෙවිය යුතු මුදල රු.376,640 ක් වුවත්, වැලි ලෝඩ් 492 ක් සඳහා රු.734,025 ක මුදලක් ගෙවා තිබූ බැවින් වැලි කියුබ් (ට්‍රැක්ටර්) 240 ක් වෙනුවෙන් රු.357,385 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

**2.10.5 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදනය භාවිතය**

---

මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(අ) පානීය ජල ළිං ඉදිකිරීමේ ව්‍යාපෘතිය

---

(i) ඉහත ව්‍යාපෘතිය යටතේ සම්මන්තුර හා ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේ දී ඉදිකරන ලද ජල ළිං 09 ක් වෙනුවෙන් ඇස්තමේන්තුව අනුව රු.1,427,640 ක් ගෙවිය යුතු වුවත් ඒ සඳහා රු.2,406,317 ක මුදලක් ගෙවා තිබූ බැවින් රු.978,667 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ තිරුක්කෝවිල් බල ප්‍රදේශයේ රු.4,160,000 ක වටිනාකමකට පානීය ජල ළිං 20 ක් ඉදිකිරීමේදී ඇස්තමේන්තුවේ සඳහන් පරිදි එක් ළිඳක ගැඹුර මීටර 7.6 ක් හා පළල මීටර 2.4 ක් පැවතිය යුතු විය. කෙසේ වුවද, ඉදිකරන ලද ළිං 20 හිම ගැඹුර හා පළල ඇස්තමේන්තුවේ ප්‍රමාණයට වඩා ඉතා අඩු මට්ටමක පැවතියදී ගෙවීම් සිදුකර තිබුණි.

(iii) අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව එක් ලිඳක් ඉදිකිරීම සඳහා රු.300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබියදී, තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් ළිඳකට අදාලව ඉදිකල යුතු වටිනාකම රු.80,000 ක් ලෙස අත්‍යවශ්‍ය අයිතම 05 ක් ඉවත් කර ඇස්තමේන්තුව සකස් කර තිබුණි. මේ හේතුවෙන් රු.මිලියන 1.6 ක උපයෝජනය කර නොතිබූ අතර, ඉදිකරන ලද ළිං 20 හි ඉදිකිරීම් ප්‍රමිතියකින් තොරව ඉදිකර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය

---

අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද MR/4/1 චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව නිවසක් ඉදිකිරීමට අදාල එක් එක් වාරික මුදල, නිවස හා සනීපාරක්ෂක ඒකකය යන දෙකෙහිම වැඩ සමාන්තරව ඉදිකිරීම පිළිබඳ සලකා බලා නිකුත් කලයුතුය. එසේ වුවත්, නාවිදන්වේලි හා අලයාඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සනීපාරක්ෂක ඒකකයේ වැඩ කටයුතු ආරම්භ නොකර තිබියදී ප්‍රතිලාභීන් 06 දෙනෙකු සඳහා වාරික මුදල් 03 ක් ලෙස රු.4,200,000 ක ලබා දී කර තිබුණි.

(ඇ) සනීපාරක්ෂක ඒකක ඉදිකිරීමේ ව්‍යාපෘතිය

---

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(i) ඉහත ව්‍යාපෘතිය යටතේ සනීපාරක්ෂක ඒකක ඉදිකිරීම අවතැන් වූ ජනතාව අදාල ප්‍රදේශවල යළි පදිංචි කිරීමෙන් පසු සිදු කල යුතු විය. එසේ වුවද, සම්මන්තුර

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2016 වර්ෂයේදී ජනතාව යළි පදිංචි කිරීමකින් තොරව ප්‍රතිලාභීන් 16 දෙනෙකු සඳහා රු.871,039 ක් වැයකර සනීපාරක්ෂක ඒකක ඉදිකර තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය වූ 2018 මාර්තු මස වන විටත් මෙම සනීපාරක්ෂක ඒකක භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ii)සනීපාරක්ෂක ඒකක ඉදිකිරීමට අදාල ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට අදාල ලියවිලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විගණනය සඳහා ඉල්ලා සිටි නමුත්, සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒවා ලබා නොදුන් බැවින් ඉඩම්වල අයිතිය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) ජීවනෝපාය සහය වැඩසටහන

---------------------------------------

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(i) මෙම වැඩසටහන යටතේ සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 06 දෙනෙකු සඳහා එකක් රු.38,500 බැගින් තරාදි 06 ක් මිලට ගැනීමට රු.231,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සමීපයේ පිහිටි අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉහත තරාදි වර්ගයම මිල එක් තරාදියකට රු.23,750 බැගින් මිලදී ගෙන තිබුණි. මේ අනුව තරාදි 06 සඳහාම රු.88,500 ක පමණ මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ii) මෙම වැඩසටහන යටතේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 28 දෙනෙකුට එළුවන් මිළදී ගෙන බෙදා දීමට රු.489,300 ක් වියදම් කර තිබුණි. ප්‍රතිලාභීන් කිහිප දෙනෙකුට ලබාදුන් එළුවන් භෞතිකව පරීක්ෂා කිරීමේදී එක් ප්‍රතිලාභියෙකුට ලබාදුන් රු.100,000 ක් පමණ වටිනාකමින් යුත් එළුවන් 06 දෙනෙකු ප්‍රතිලාභියා සතුව නොමැති බව නිරීක්ෂණය විය.

(iii) මෙම එළුවන් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන තීරණය අනුව මිලදී ගත යුත්තේ ජමුනා මිශ්‍ර එළුවන් වූවත්, ඒ වෙනුවට දේශීය එළුවන් මිලදී ගෙන තිබුණි. ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම දේශීය එළුවන් මිලදී ගැනීම සඳහා ගෙවූ මිල ගණන් සමඟ සැසඳීමේදී තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එළුවන් මිලදී ගැනීම සඳහා රු.117,950 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) ප්‍රතිලාභ ලබාදීමේදී ව්‍යාපෘතිය සාර්ථක කරගෙන යාමට හැකි පරිදි නිවැරදි ප්‍රතිලාභීන් තෝරාගත යුතු වූවත්, නාවින්දවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වයස අවුරුදු 90 ක් වූ ප්‍රතිලාභියෙකුට රු.28,380 ක වටිනා කුකුල් පැටව් 90 ක් ලබා දී තිබූ අතර 2018 මැයි 25 දින වන විට කුකුල් පැටව් 75 දෙනෙකු මියගොස් තිබුණි.

(v) මෙම ව්‍යාපෘතිය යටතේ නාවින්දවෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එක් ප්‍රතිලාභියෙකුට ලබාදුන් රු.42,500 ක යන්ත්‍රයක් 2018 මැයි 25 දින වන විටත් භාවිතා නොකර නිෂ්කාර්යව තිබුණි. එසේම මෙම ප්‍රතිලාභියාට

හා තවත් ප්‍රතිලාභීන්ට ලබාදුන් රු.66,000 ක වටිනා වතුර පොම්ප 02 ක් අස්ථානගත වී ඇති බව නිරීක්ෂණය විය.

**2.10.6 කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

ඉහත අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි ය.

(i) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ගැබිනි මව්වරුන් සඳහා වන ආහාර ලබා දීමේ වැඩ සටහන වෙනුවෙන් නිකුත් කළ චක්‍රලේඛය අනුව රු.2,000 ක වටිනාකමකට ලබා දෙනු ලබන භාණ්ඩ වෙනුවෙන් ප්‍රතිලාභීන්ට බිල්පතක් ලබා දිය යුතු වුවත්, තෝරා ගත් සැපයුම්කරුවන් 03 දෙනෙකු විසින් අදාල භාණ්ඩ සඳහා බිල්පත් නිකුත් කර නොතිබුණි.

(ii)පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සැපයුම්කරුවන් සමඟ අත්සන් කළ ගිවිසුම අනුව ගැබිනි මව්වරුන් සඳහා බෙදා දෙනු ලබන භාණ්ඩ සම්බන්ධයෙන් ඒවා බෙදා දීමට පෙර ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් භාණ්ඩ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 සැප්තැම්බර් 30 දක්වා මෙම ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 70.00 | 72.18 | 48.00 | 52.66 | 240.00 | 171.78 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත්කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.350,290 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 08 ක සිට මාස 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට අපොහොසත් වි තිබුණි.

## 2.12 අග්‍රිම ගිණුම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබුණු අග්‍රිම ඇස්තමේන්තුව අනුව මාසික ලබා ගැනිමට අපේක්ෂා කළ අග්‍රිමයන්, මාසික ඉල්ලුම්කල අග්‍රිමයන් හා ලැබී තිබුණු අග්‍රිමයන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| මාසය | ඉල්ලුම් කළ අග්‍රිමය | ලැබී තිබුණු අග්‍රිමය | ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබී තිබුණු අග්‍රිමය අතර වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ජනවාරි | 180,119,000 | 133,119,000 | 47,000,000 |
| පෙබරවාරි | 148,619,000 | 200,425,000 | (51,806,000) |
| මාර්තු | 101,619,000 | 144,425,000 | (42,806,000) |
| අප්‍රේල් | 280,000,000 | 169,068,000 | 110,932,000 |
| මැයි | 311,100,000 | 234,868,000 | 76,232,000 |
| ජුනි | 476000,000 | 187,068,000 | 288,932,000 |
| ජුලි | 579,462,000 | 261,318,000 | 318,144,000 |
| අගෝස්තු | 544,677,000 | 231,280,000 | 313,397,000 |
| සැප්තැම්බර් | 250,338,000 | 236,330,000 | 14,008,000 |
| ඔක්තෝබර් | 368,708,000 | 336,811,000 | 31,897,000 |
| නොවැම්බර් | 644,462,000 | 326,905,000 | 317,557,000 |
| දෙසැම්බර් | 674,928,000 | 616,009,000 | 58,919,000 |
| එකතුව | 4,560,032,000 | 3,077,626,000 | 1,482,406,000 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එක් එක් මාසය තුල ඉල්ලුම් කලයුතු අග්‍රිම අවශ්‍යතාවය කොපමණද යන්න සැලසුම් කර නොතිබුණි.

(ii) සැලසුම්කල පරිදි නියමිත කාල වකවානුවල අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා නියමිත කාලය තුල අග්‍රිම මුදල් නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පහත සඳහන් කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

| කාර්යය | අමාත්‍යාංශය | ප්‍රතිපාදන | 2017 දෙසැම්බර් 31 වන විට නොලැබූ අග්‍රිම මුදල |
|---|---|---|---|
| | | රු. | රු. |
| පාලමුන මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය | ක්‍රීඩා සංවර්ධන අමාත්‍යාංශය | 1,000,000 | 1,000,000 |
| දෙහිඅත්තකණ්ඩිය නිල නිවාස ඉදිකිරීම | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 9,000,000 | 2,298,778 |

(iii) වර්ෂය මුල ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබූ නමුත්, වර්ෂය අවසානයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබී ඇති නමුත් අග්‍රිම මුදල් දෙසැම්බර් 31 දිනට පෙර නොලැබීම නිසා මුළු ප්‍රතිපාදන රු.285,060,879 ක් වූ ව්‍යාපෘති වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට නොලැබුණු අග්‍රිම වටිනාකම රු.165,212,881 ක් විය. විස්තර පහත දැක්වේ.

| **ව්‍යාපෘති ගණන** | **අමාත්‍යාංශය** | **ප්‍රතිපාදන** | **2017 දෙසැම්බර් 31 වන විට නොලැබූ අග්‍රිම මුදල** |
|---|---|---|---|
| | | රු. | රු. |
| විවිධ ව්‍යාපෘති 07 | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | 52,310,879 | 52,310,879 |
| විවිධ ව්‍යාපෘති 08 | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | 55,250,000 | 55,250,000 |
| විවිධ ව්‍යාපෘති 03 | ජාතික සමඟිය හා සංහිඳියා අමාත්‍යාංශය | 27,500,000 | 18,956,699 |
| විවිධ ව්‍යාපෘති 37 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 150,000,000 | 38,695,303 |
| | | 285,060,879 | 165,212,881 |

## 2.13 පොදු තැන්පත් ගිණුම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් අක්කරපත්තු හා සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පිළිවෙලින් රු.7,898,030 ක් හා රු.5,631,000 ක් ලබා දී තිබුණු අතර එම මුදල් අදාල කාර්යය භාරයන් ඉටු නොකර මාස 05 කට ආසන්න කාලයක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 2.14 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කල්මුණේ හා ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** | **නිරීක්ෂණ** |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| වත්කම් ලේඛනය | චක්‍රලේඛය | |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |

## 2.15 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 371 (5 ) | 40,000 | වැඩය නිමකර දින 10 ක් තුල ලබාගත් අත්තිකාරම් පියවීම සිදුකල යුතු වුවත්, කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 02 කදී මාස 03-04 ක් යනතුරුත් අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137, 138 හා 139 | 1,000,000 | භාණ්ඩ හෝ සැපයුම් ලැබීමෙන් පසුව එයට අදාල චෙක්පත් හා ගෙවීම් ක්‍රියාවලිය සිදුකළ යුතුය. එයට පටහැනිව නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රීඩා උපකරණ මිලදී ගැනීමට අදාලව චෙක්පතක් ලියා අත රඳවාගෙන තිබුණි. කෙසේ වුවද, ක්‍රීඩා උපකරණ විගණිත දින වනවිටත් ලැබී නොතිබුණි. |
| (iii) -එම- | 958,560 | පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොලමන්තලාව නීල සෙවන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ඉදිකිරීම් අවසන් නොකරන ලද කාර්යයන් ඇතුලත්ව සම්පූර්ණ වටිනාකම වූ රු.958,560 ක වටිනාකමකට 2017 දෙසැම්බර් 30 ලියන ලද චෙක්පත 2018 මාර්තු 29 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 137, 138 හා 139 | 1,421,017 | පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගල්ඔඩේ නීල සෙවන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව ඉදිකිරීම් අවසන් නොකරන ලද කාර්යයන් ඇතුලත්ව සම්පූර්ණ වටිනාකම වූ රු.921,338 ක් හා රු.499,679 ක වටිනාකමකට 2017 දෙසැම්බර් 30 දින නිකුත් කරන ලද චෙක්පත් 02 ක් නිකුත් කිරීමකින් තොරව 2018 මාර්තු 29 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 135 | 1,755,425 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂය සඳහා නිකුත් කරන ලද අධිකාරි බලතල පැවරීම යටතේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවට උපකරණ මිලදී ගැනීම සඳහා පවතින සීමාව රු.1,000,000 ක් වුවත්, එයට පටහැනිව අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.1,755,425 ක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන තීරණ ගෙන එම මිලදී ගැනීම් සිදුකර තිබුණි. |

**(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

-----------------------------

| | | |
|---|---|---|
| 5.4.12 මාර්ගෝපදේශය | 1,355,969 | ගෙවනු ලබන එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර එළැඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට යැවිය යුතු වුවද අලයාඩිවෙම්බු හා තිරුක්කකෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පිළිවෙලින් රු.854,151 ක් හා රු.501,818 ක් වූ එකතු කල අගය මත බදු ගෙවා තිබුණද ඒ පිළිබඳ විස්තර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

### 2.15.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

---------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රමිතිගත ලංසු ලේඛන (S.B.D) 13.3 අනුව ලංසුකරුවන් එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇත්නම් එකතුකල අගය මත බදු සඳහා අදාල ලිපිලේඛන ලංසු ඉදිරිපත් කර අවස්ථාවේදීම ලබාදිය යුතු වුවත්, එම ලේඛන ඉදිරිපත් නොකර තිබිය දී ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.213,770 ක එකතුකල අගය මත බදු මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි නම් ඇස්තමේන්තු සැකසීමේදී එකතුකල අගය මත බදු සහිතව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත්, ජල ළිං 20 ක් සඳහා ඇස්තමේන්තු එකතුකල අගය මත බදු රහිතව ඉදිරිපත් කර තිබිය දී තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.501,818 ක මුදලක් එකතුකල අගය මත බදු ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 2.16 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 691 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික වියදම රු.339,744 ක් වී තිබුණු අතර, අදාල පුරප්පාඩු පිරවීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 97 | 83 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 76 | 24 | 52 |
| (iii) | ද්විතියික මට්ටම | 1,933 | 1,690 | 243 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 257 | 237 | 20 |
| | | 2,363 | 2,034 | 329 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

පසුගිය වර්ෂ 05 තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සේවකයන් පුහුණු කිරීම වෙනුවෙන් රු.7,350,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින පුහුණුව නොලත් සේවකයන් ගණන පසුගිය වසර 05 තුල 396 සිට 546 දක්වා පරාසයක් ගෙන තිබුණි.